# ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
## ඔබගේ ණය තොරතුරු වාර්තාව නිවැරදිව හඳුනා ගනිමු.

### ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය හෝ CRIB යනු කුමක්ද?

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය 1990 අංක 18 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම පනත පසුව 1995 අංක 08 සහ 2008 අංක 42 ලෙස සංශෝධනයට ලක්ව ඇත.
රජය සහ පෞද්ගලික යන දෙඅංශයේම සාමූහික හිමිකාරත්වයෙන් පිහිටුවා ඇති ණය තොරතුරු කාර්යාංශයෙහි හිමිකාරත්වය ශ්‍රී ලංකා මහ බැංකුව, සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂ බැංකු, බලපත්‍රලාභී කල්බදු සහ මූල්‍ය සමාගම් විසින් දරනු ලැබේ. මෙම ආයතනවලට අමතරව මුදල් අමාත්‍යවරයා විසින් ණය දෙන ආයතන ලෙස ගැසට් කරන ලද අනෙකුත් ආයතන කිහිපයක්ද මෙහි කොටස්කරුවන් වෙති.
ඉහත සඳහන් කළ සියළු ආයතන පොදුවේ ''කොටස් හිමි ණය දෙන ආයතන'' ලෙස හඳුන්වනු ලබන්නේ ඔවුනට ණය තොරතුරු කාර්යාංශයෙහි ඇති කොටස් හිමිකාරත්වය නිසාවෙනි.
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙහි කළමනාකරණ කටයුතු මෙහෙයවනු ලබන්නේ පනතේ 05 වන කොටසේ නියමයන්ට අනුකූලව පත්කරනු ලබන අධ්‍යක්‍ෂක මණ්ඩලයක් මගිනි. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සැමවිටම කටයුතු කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙකු වන අතර අනෙකුත් අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් සෙසු සාමාජික ආයතන නියෝජනය වන පරිදි පත්කෙරෙනු ලැබේ.

### ඔබගේ ණය තොරතුරු වාර්තාව (iReport) යනු කුමක්ද?

කාර්යාංශයේ සාමාජික ණය දෙන ආයතන (බලපත්‍රලාභී ණය දෙන ආයතන) තම ණයකරුවන්ගේ සෑම ණය පහසුකමකටම අදාල තොරතුරු පූර්ණ වශයෙන් කාර්යාංශයට ලබාදීමට පනතේ නියමයන්ට අනුකූලව නීතියෙන් බැඳී සිටී. දැනට පවත්නා සහ අළුතින් ප්‍රදානය කරන ලද ණය පහසුකම්වල සියළුම තොරතුරු සෑම මසක් අවසානයේම කාර්යාංශයට වාර්තා කිරීම සහ යාවත්කාලීන (update) කිරීම සිදුකළ යුතුය. ''ණය තොරතුරු වාර්තා'' ලෙස මෙම තොරතුරු ආපසු සාමාජික ආයතන වෙත ඉල්ලීමක් කළ විටෙක ලබාදීමට කාර්යාංශය බැඳී සිටී.
කාර්යාංශය සතුව පවතින ණය තොරතුරු පුද්ගල සහ ව්‍යවසාය ලෙස වර්ග කෙරේ.
එලෙස සැකසුනු "iReport" නම් වූ ඔබගේ ණය තොරතුරු වාර්තාව මෙසේ ඔබ අතට පත්වනුයේ පුද්ගලයකු හෝ ව්‍යවසායක් ලෙස එය ලබාගැනීමට ණය තොරතුරු කාර්යාංශ පනත මගින් ඔබ වෙත ලබාදී ඇති බලතලවලට අනුකූලවය.
iReport හි අන්තර්ගත සියළුම තොරතුරු, ණය දෙන ආයතන මගින් කාර්යාංශයට වාර්තා කළ ආකාරයටම එහි සඳහන්වේ.

වර්තමානයේ සියළුම ණය තොරතුරු වාර්තා කිරීම සහ යාවත්කාලීන කිරීම සිදුකරනු ලබන්නේ නවීන පරිගනක තාක්ෂණය මත පදනම් වූ පද්ධති සහ ක්‍රමවේදයන් මඟිනි. එබැවින් එම තොරතුරු නිවැරදි හෝ නිසිපරිදි යාවත්කාලීන නොවේ නම් එය ණය දෙන ආයතනය මගින් වාර්තා කිරීමේදී ඇතිවූ තාක්ෂණික දෝෂයක් වීමට ඉඩ ඇති අතර අදාල තොරතුරු නිවැරදි කරගැනීමට අවශ්‍ය කටයුතු කාර්යාංශය මගින් කිසිදු අයකිරීමකින් තොරව කරදෙනු ලැබේ. ඒ සඳහා iReport සමඟ ඔබට ලැබෙන දත්ත පිළිබඳ ආරවුල් නිරාකරණය සඳහා වූ පෝරමය (Dispute Resolution Form) පුරවා කාර්යාංශය වෙත ලබාදිය යුතුය.

### ඔබගේ ණය තොරතුරු වාර්තාව වැදගත් වන්නේ ඇයි?

iReport යනු ඔබ විසින් විවිධ ණය දෙන ආයතන මගින් ලබාගත් සියළුම ණය සහ එම ණය ආපසු ගෙවීමේ අතීතය පිළිබඳ තොරතුරු ඇතුලත් සංක්ෂිප්ත වාර්තාවකි.
ණය දෙන ආයතන ඔබට ණය පහසුකමක් ප්‍රදානය කිරීමට ප්‍රථම ඒ සඳහා වන ඔබගේ යෝග්‍යතාවය මෙම වාර්තා ඇසුරින් අධ්‍යයනය කරනු ලැබේ. යහපත් ණය ආපසු ගෙවුම් අතීතයක් පවත්වා ගැනීම නැවත ණය පහසුකමක් ලබාගැනීමේදී පිටුවහලක් වනු ඇත.
සය මසකට වරක්වත් ඔබගේ ණය තොරතුරු වාර්තාව (iReport) ලබාගැනීම තුලින් එහි අන්තර්ගත තොරතුරුවල නිරවද්‍යතාවය සහ යාවත්කාලීන බව සනාථ කරගත හැකිවෙනු ඇත.
කිසියම් ණය පහසුකමක් ඉල්ලුම් කිරීමට පෙර ඔබගේ iReport හි අන්තර්ගතය පිළිබඳව වැටහීමක් සහිතව සිටීම එම ක්‍රියාවලියේදී ඔබට පහසුවක් වනු ඇත.
ණය තොරතුරු කාර්යාංශයක් පැවතීම ඕනෑම රටක ආර්ථිකයේ දියුණුව උදෙසා සෑම අංශයකටම පහසුවෙන් ණය ගලායෑම විධිමත් හා කඩිනම් කිරීමට නිරන්තරයෙන්ම උදව්වන බව පිළිගෙන ඇත. පහත සඳහන් කරුණු එය තවදුරටත් තහවුරු කරනු ඇත.

- ණයකරුවන්ගේ සහ අනාගත ණයකරුවන්ගේ පෙර හා වර්තමාන ණය පිළිබඳ විස්තර කාර්යක්ෂම ලෙස එකම මූලාශ්‍රයකින් ලබාගැනීමට හැකිවීම තුලින් ණය දෙන ආයතනයන්හි පරිපාලන හා මෙහෙයුම් වියදම් අවම කරගැනීමට හැකිවේ. එමගින් ණය ගැණුම්කරුවන්හට වාසි සැලසේ.
- විශ්වාසදායී හා සාර්ථක ණය ගැණුම්කරුවන් නිවැරදිව තෝරාගැනීමට හැකිවීම හා ඔවුන්ට ඉක්මණින් හා පහසුවෙන් ණය ලබාගැනීමට හැකිවීම.
- ණය දෙන ආයතන අතර තරඟකාරීත්වය වැඩිවීම තුලින් ණය ගැණුම්කරුවන්ට සහනදායී තත්වයන් යටතේ ණය ලබාදීමට පෙළඹවීමත් ඇතිවේ.

මෙවැනි ආයතනයක් පිහිටුවා නොමැති අවස්ථාවක ඉහත සඳහන් කාර්යයන් දුෂ්කර වන අතර ණය පහසුකමක් ලබාගැනීමේ ක්‍රියාවලියට එය බාධාවක් වන බව ඔබට වැටහෙනු ඇත.

### තමාගේ ණය යෝග්‍යතාවය (ණය පහසුකමක් ලබාගැනීමට ඇති හැකියාව) වර්ධනය කරගත හැක්කේ කෙසේද?

- සැමවිටම ආදායම හා වියදම් අතර සමතුලනයක් පවත්වා ගැනීම හා ආපසු ගෙවීමේ හැකියාව මත පමණක් ණය ලබාගැනීම.
  [මූලික අවශ්‍යතා සඳහා මාසික වියදම් (විදුලිය, ජලය හා දුරකථන ආදී සේවා සඳහා මාසික ගෙවීම්, අනෙකුත් ගෘහ හා පෞද්ගලික අවශ්‍යතා සඳහා අනිවාර්යය වියදම්) පිළිබඳ වැඩි සැලකිල්ලක් දැක්වීම.]
- ණය හා මූල්‍ය පහසුකම් ලබාගැනීමට ප්‍රථම, ඒ හා සම්බන්ධ ගිවිසුම්වල අන්තර්ගත කොන්දේසි - වගකීම් පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීම (Terms & Conditions of Loan Agreements).
- ණය වාරික ආපසු ගෙවීම ගිවිසගත් ආකාරයටම සිදුකිරීම අත්‍යාවශ්‍යය වන අතර හැකියාවක් ඇතිවිට කඩිනමින් ගෙවා අවසන් කිරීම යෝග්‍යවේ. විශේෂයෙන්ම ක්‍රෙඩිට් කාඩ්පත් ශේෂයන් පූර්ණ වශයෙන් ගෙවා නිමකිරීම ඔබගේ ණය යෝග්‍යතාවය යහපත් තත්වයකට ගෙන ඒමට හොඳ පිටිවහලක් වනු ඇත.

**ඔබගේ ණය තොරතුරු වාර්තාවේ අන්තර්ගත තොරතුරු.**

Report Header - වාර්තාවේ ශීර්ෂය වාර්තාවේ ශීර්ෂය පහත සඳහන් තොරතුරුවලින් සමන්විතවේ.
iReport Number - ණය තොරතුරු වාර්තාව සඳහා කාර්යාංශය මගින් නිකුත් කරන ලද අංකය.
Report Order Date - ණය තොරතුරු වාර්තාව නිකුත් කළ දිනය.
Product Name - ණය තොරතුරු වාර්තාව අයත් වාර්තා වර්ගය (iReport).
Reason - ණය තොරතුරු වාර්තාව ඉල්ලුම් කරන ලද හේතුව.
(තම ණය තොරතුරු වාර්තාව ලබාගැනීම සඳහා)
Search Details - ඔබගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් / ගමන් බලපත්‍ර අංකය, ලිපි ලැබෙන ලිපිනය, ස්ත්‍රී/පුරුෂ භාවය, ඔබගේ අයදුම්පතෙහි සටහන් කළ ආකාරයට මෙහි දැක්වේ.
Demographic Details - පුද්ගලමය තොරතුරු.

මෙම තීරයෙහි ඔබගේ සම්පූර්ණ නම, උපන්දිනය, ස්ත්‍රී/පුරුෂ භාවය, පුරවැසිභාවය, විවාහක/ අවිවාහක බව, විවාහක සහකරුගේ හෝ සහකාරියගේ නම සහ දුරකථන අංක ආදී පෞද්ගලික තොරතුරු අදාල ණය දෙන ආයතන මගින් වාර්තා කළ ආකාරයට දක්වා ඇත.

Mailing Address - ණය දෙන ආයතන මගින් ආසන්නතම කාලසීමාවක් තුල වාර්තා කරන ලද ඔබගේ ලිපි ලැබෙන ලිපින තුනක් පිළිවෙලින් මෙහි දැක්වේ.
Permanent Address - ණය දෙන ආයතන මගින් ආසන්නතම කාලසීමාවක් තුල වාර්තා කරන ලද ඔබගේ ස්ථිර ලිපින තුනක් පිළිවෙලින් මෙහි දැක්වේ.
ID Details - හැඳුනුම්පත් සම්බන්ධ තොරතුරු.
NIC Number - ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය. (ශ්‍රී ලාංකිකයින් සඳහා අනිවාර්යවේ)
Passport Number - වලංගු විදේශ ගමන් බලපත්‍ර අංකය. (ශ්‍රී ලාංකික නොවන පුද්ගලයන් සඳහා අනිවාර්යවේ)
Driving License Number - වලංගු රියදුරු බලපත් අංකය. (වාර්තාවී ඇතිවිට පමණි)
Employment Details - ණය දෙන ආයතන මගින් ආසන්නතම කාලසීමාවන් තුල වාර්තා කරන ලද ඔබගේ වෘත්තීය/රැකියා පිළිබඳ විස්තර.
Relationship Details - තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර සඳහා පමණක් ඔබගේ ඇති සබඳතා වාර්තා වී ඇත්නම් එම තොරතුරු මෙහි දැක්වේ.
Related Entity Name - එම ව්‍යාපාරයන්හි ලියාපදිංචි නාමයන්
Related Type - පුද්ගල ණය තොරතුරු වාර්තාවන්හි මෙම සම්බන්ධය ''පුද්ගල'' ලෙස සැමවිටම දැක්වේ.
Nature of Relationship - ඔබගේ එම ව්‍යාපාරික සබඳතාවයෙහි ස්වරූපය.

## Summary of Potential & Current Liabilities - වර්තමානයේ පවතින සහ අනාගතයෙහි ගෙවීමට ඇති ණය සම්බන්ධ බැඳීම්වල සාරාංශයන්.

මෙහි ඔබ විසින් තනි පුද්ගලයකු ලෙස ලබාගත්, බද්ධ ණයකරුවකු (Joint Borrower) ලෙස සම්බන්ධ වූ සහ ඇපකරුවකු ලෙස බැඳීම් ප්‍රකාශ කළ සියළු ණය පහසුකම්වල තොරතුරු අඩංගුවේ.

Currency - ණය පහසුකම ප්‍රදානය කළ මුදල් වර්ගය.
Ownership - ණය පහසුකමෙහි හිමිකාරත්වය.
As Borrower - ඔබ විසින් තනි පුද්ගල ණයකරුවකු ලෙස ඉදිරිපත් වී ණය දෙන ආයතන මගින් ලබාගත් ණය පහසුකම්වල සාරාංශයන් මෙහි දැක්වේ.
As Guarantor - ඔබ විසින් ඇපකරුවකු ලෙස ඇපවී ඇති ණය පහසුකම්වල සාරාංශයන් මෙමගින් දැක්වේ.
Total Number of Credit Facilities - මුළු ණය පහසුකම් සංඛ්‍යාව.
As Borrower - තනි පුද්ගල ණයකරුවකු ලෙස ලබාගෙන ඇති ණය පහසුකම් සංඛ්‍යාව.
As Guarantor - ඇපකරුවකු ලෙස ඇපවී ඇති ණය පහසුකම් සංඛ්‍යාව.
Total Amount Granted Limit - ප්‍රදානිත ණය පහසුකම්වල සමස්ථ වටිනාකම හෝ ණය සීමාව.
As Borrower - තනි පුද්ගල ණයකරුවකු ලෙස ලබාගෙන ඇති ණය පහසුකම්වල සමස්ථ වටිනාකම.
As Guarantor - ඇපකරුවකු ලෙස ඇපවූ ණය පහසුකම්වල සමස්ථ වටිනාකම.
Total Outstanding - ඉදිරියෙහිදී ගෙවා නිමකිරීමට ඇති සමස්ථ ණය ප්‍රමාණයේ වටිනාකම.
As Borrower - ණයකරු ලෙස ලබාගත් ණය පහසුකම් සඳහා තවදුරටත් ගෙවා නිමකිරීමට ඇති සමස්ථ වටිනාකම.
As Guarantor - ඇපකරුවකු ලෙස ඇපවී ඇති ණය පහසුකම්වල තවදුරටත් ගෙවා නිමකිරීමට ඇති සමස්ථ වටිනාකම.

**Dishonoured Cheque Summary - ජංගම ගිණුමෙහි ප්‍රමාණවත් පරිදි මුදල් නොමැතිවීම මත අගරු කරන ලද චෙක්පත් පිළිබඳ සාරාංශය.**

Currency - චෙක්පත නිකුත් කර ඇති මුදල් වර්ගය.
Number of Cheques Dishonoured - ජංගම ගිණුමෙහි ප්‍රමාණවත් පරිදි මුදල් නොමැතිවීම මත අගරු වී ඇති සමස්ථ චෙක්පත් සංඛ්‍යාව.
Total Amount of Dishonoured Cheques - අගරුවී ඇති චෙක්පත්වල සමස්ථ මූල්‍ය වටිනාකම.

## Status of Credit Facilities at a Glance

ඔබගේ iReport වාර්තාව නිකුත් කළ දිනට අනුකූලව, ඔබහට ණයකරුවකු හා ඇපකරුවකු ලෙස වාර්තාවී ඇති සියළු ණය පහසුකම්වල ස්වභාවය සහ ණය ආපසු ගෙවීමේදී හටගත් හිඟ දින ගණන සැලකිල්ලට ගෙන සාරාංශයක් ලෙස මෙහි දක්වා ඇත.

## Inquiries made in last 06 months by lending institutions

ණය දෙන ආයතන මගින් පසුගිය සය මසක කාලය තුල ඔබගේ ණය තොරතුරු වාර්තාව සඳහා කළ විමසීම් පිළිබඳ පහත සඳහන් විස්තර මෙහි දැක්වේ.
විමසීම කළ දිනය, ණය දෙන ආයතනයේ නම සහ ශාඛාව, වාර්තාව ලබාගැනීමට හේතුව, භාවිතා කළ ණය තොරතුරු වාර්තා වර්ගය, ඉල්ලුම් කළ ණය පහසුකම, මුදල් වර්ගය සහ එහි වටිනාකම.
ණය තොරතුරු කාර්යාංශයේ පනතට අනුකූලව, ණය දෙන ආයතනයන්ට ඔබගේ ණය තොරතුරු වාර්තාව ලබාගත හැකි වන්නේ පහත සඳහන් කාර්යයන් සඳහා පමණි.

- ණයකරුවකු ලෙස නව ණය පහසුකමක් සඳහා යෝග්‍යතාවය ඇගයීමට.
- ඇපකරුවකු ලෙස නව ණය පහසුකමක් සඳහා සළකා බැලීමට.
- හවුල්කරුවකු / තනි පුද්ගල ව්‍යාපාරිකයෙකු ලෙස නව ණය පහසුකමක් සඳහා සළකා බැලීමට.
- ලියාපදිංචි සමාගමක අධ්‍යක්ෂකවරයකු ලෙස නව ණය පහසුකම් සඳහා සළකා බැලීමට.
- දැනට සිටින ණයකරුවකුගේ ණය තොරතුරු නිරීක්ෂණය කිරීමට.
- ජංගම ගිණුමක් විවෘත කිරීම සඳහා.

සැ.යු. :- ඉහත සඳහන් තත්වයන්ට පරිභාහිරව හෝ ඔබගේ අනුදැනුමක් නොමැතිව කුමන හෝ ණයදෙන ආයතනයක් විසින් ඔබගේ ණය තොරතුරු වාර්තාව ලබාගෙන ඇත්නම්, ඔබ ඒ පිළිබඳව කාර්යාංශය දැනුවත් කළයුතුය.

**Inquiries Made in Last 06 months by the subject - ඔබවිසින් iReport සඳහා පසුගිය ආසන්නතම සය මසක කාලය තුල කරන ලද විමසීම් මෙම කොටසින් දැක්වේ.**

**Credit Facility Details - වාර්තා වී ඇති ණය පහසුකම් පිළිබඳ විස්තර.**

සෑම ණය පහසුකමකටම අදාළ තොරතුරු කෙටි නාම (කේත) භාවිතයෙන් මෙහි ඉදිරිපත්කර ඇති අතර ඔබගේ iReport වාර්තාවට පමණක් අදාළවන කෙටි නාමයන්වල විග්‍රහයන් මෙම වාර්තාව අවසානයේ කේත වගු (Catalogue Description) මඟින් සවිස්තරාත්මකව දක්වා ඇත. දැනට කාර්යාංශය භාවිතා කරන සියළුම කේතයන් සහ ඊට අදාළ විස්තර ඔබගේ දැනගැනීම පිණිස, වාර්තාවේ දැක්වෙන අනුපිළිවෙලට පහත දැක්වේ.

No – එක් එක් ණය පහසුකම සඳහා කාර්යාංශය මඟින් වෙන්කළ අනු අංකය.

**Institution Category – ණයදෙන ආයතනය අයත් ආයතන වර්ගය.**

CBC - බලපත්‍රලාභී වාණිජ බැංකු.
SBC - බලපත්‍රලාභී විශේෂ බැංකු.
LCC - බලපත්‍රලාභී ලිසිං සමාගම්.
FCC - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්.
OIC - කාර්යාංශ පනතට අනුකූලව ණයදෙන ආයතන ලෙස පිළිගෙන ඇති අනෙකුත් ආයතන.

**Inst – Branch – (Institution & Branch) - ණය පහසුකම වාර්තා කරන ලද ණයදෙන ආයතනය සහ ශාඛාවේ කේත අංක.**

ඔබට ණය තොරතුරු වාර්තාකර ඇති ණයදෙන ආයතන පමණක් කේත වගුවේ දක්වා ඇත. මෙම කේතයන් කාර්යාංශය මඟින් අදාළ ණයදෙන ආයතන සහ ශාඛා හඳුනා ගැනීම සඳහා නිකුත් කරන ලද ඒවා වේ.

**CF Type – (Credit Facility Type) – ණය වර්ගය.**

BKGR - බැංකු ඇපකරය / Bank Guarantee.
CRCD - ක්‍රෙඩිට් කාඩ්පත / Credit Card.
HRPH - කල්බදු / Hire Purchase.
LEAS - ලිසිං / Leasing.
OVDR - බැංකු අයිරා / Over Draft.
LOAN - ණය / Loan.
LTCR - ණයවර ලිපි / Letter of Credit
OTHR - අනෙකුත් ණය/අනෙකුත් ණය වර්ග/ Other
CNDS - පාරිභෝගික පහසු ගෙවීමේ ක්‍රම මත ප්‍රදානිත ණය / Consumer Durables

**CF Status – (Credit Facility Status) – ණය පහසුකම පවත්නා ස්වභාවය.**

සැ.යු :- ණය පහසුකම අවසන්වරට යාවත්කාලීන වූ හෝ වාර්තා වී ඇති දිනට පැවති ස්වභාවය මෙහි දැක්වේ.

ACTV - දැනට ක්‍රියාකාරීත්වයේ ඇති / Active.
LGAL - නීතිමය පියවර ගෙන ඇත/ Legal Action.
LBGV - රජයද වගකීම සඳහා බැඳී සිටී/ Liability Assumed by Govt.
NATD - ස්වභාවික විපත් බලපා ඇත/ Natural Disaster Affected.
CLSD - වසා ඇත/ Closed (ණයදෙන ආයතනය විසිනි).
RSTR - ප්‍රතිව්‍යුහගතකර ඇත/ Restructured.
SETL - සම්පූර්ණයෙන්ම ගෙවා නිමකර ඇත/ Settled.
TRMN - සේවාව හෝ පහසුකම අත්හිටුවා ඇත/ Terminated.
WRTN - පූර්ණ හෝ අර්ධ වශයෙන් කපා හරින ලද/ Written Off.
R&SL - හිමිකම පවරාගෙන විකුණා ඇත/ Repocessed & Sold.
R&ST - හිමිකම පවරාගෙන පියවා ඇත/ Repocessed & Settled.
PACT - පරාටේ නීති ක්‍රියාකාරකම් මඟින් පියවීම සඳහා යොමුකර ඇත/ Parate Action.
ARBT - බේරුම් කිරීම සඳහා යොමුකර ඇත/ Arbitration.
STTC - අධිකරණයේ මැදිහත්වීම මත ගෙවා නිමකර ඇත/ Settled Through Court.
FCAN - පහසුකම අවලංගු කර ඇත/ Facility Cancelled.

**Own – Shp – (Ownership) – ණය පහසුකමෙහි හිමිකාරත්වය.**

OWN - තමන් විසින් ලබාගත් (තනි පුද්ගල ණයකරුවෙකු ලෙස)/ Own.
PCD - මූලික කාඩ්පත හිමිකරු /Primary Card Holder.
SCD - උප/ අතිරේක කාඩ්පත් හිමිකරු/ Supplementary Card Holder.
JNT - බද්ධ ණයකරු/ Joint Borrower.
GRT - ඇපකරු/ Guarantor.

Amount Granted Limit – මෙමඟින් ප්‍රදානය කර ඇති ණය මුදල දැක්වේ. බැංකු අයිරා සහ ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා මෙය අනුමත ණය සීමාව ලෙස පිළිගනේ.

Current Balance – ණය මුදල අවසන් වරට වාර්තා වී ඇති දිනය වන විට අනාගතයේදී සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීමට ඉතිරිව ඇති මුළු මුදල මෙමඟින් දැක්වේ. මෙම වටිනාකම තුල ප්‍රදානිත මුදල, පොලිය, හිඟ මුදල් සහ අනෙකුත් සේවා සහ පහසුකම් ගාස්තු ඇතුලත් විය හැක.

Arrears Amount – අවසන් වරට වාර්තා වී ඇති දිනට පැවති හිඟ මුදල මේ යටතේ දැක්වේ.

Installment – වාරික වශයෙන් ගෙවීම් සිදුකරන විටෙක එක් වාරිකයක වටිනාකම මෙමඟින් දැක්වේ.

Amount Written Off – ණය පහසුකමක් අර්ධ හෝ පූර්ණ වශයෙන් කපාහැර ඇති අවස්ථාවක, එම කපාහැර ඇති වටිනාකම මෙමඟින් දැක්වේ.

Reported Date – ණයදෙන ආයතන විසින් අවසන්වරට ණය පහසුකම පිළිබඳ තොරතුරු යාවත්කාලීන කළ දිනය.

First Disburse Date – (First Disbursement Date) – ණය පහසුකම ප්‍රදානය කළ දිනය.

Latest Payment Date – (Date of Latest Payment Received) – ණය වාරිකය හෝ අදාළ ගෙවීමක් සිදුකළ ආසන්නතම දිනය.

Restructuring Date – ණය පහසුකමක් ප්‍රතිව්‍යුහගතකර ඇති විටෙක, එය ප්‍රතිව්‍යුහගත කළ දිනය.

End Date – (Credit Facility End Date) – ණය පහසුකම ගෙවා නිම කළ හෝ අවසන් කළ දිනය මෙමඟින් දැක්වේ. මෙම දිනය ණය පහසුකමේ ස්වභාවය (Status) වාර්තාකර ඇති ආකාරය අනුව අර්ථ ගන්වාගත යුතුය.

**Repay Type – (Repayment Type) - ගිවිස ගෙන ඇති ණය ආපසු ගෙවීමේ ක්‍රමය.**

- BALN - ක්‍රමයෙන් වටිනාකම හින වී යන පරිදි කොටස් කිහිපයකින් ගෙවීම / Balloon.
- BMLY - දෙමසකට වරක් ගෙවීම/ Bi – Monthly.
- BULT - සමස්ථ ණය මුදල එකවර ආපසු ගෙවීම / Bullet.
- DMND - ඉල්ලුම මත ගෙවීම/ On Demand.
- MNLY - මාසිකව ගෙවීම/ Monthly.
- QRLY - කාර්තු වශයෙන් ගෙවීම/ Quarterly.
- SMAN - අර්ධ වාර්ෂිකව ගෙවීම/ Semi-Annual.
- WKLY - සතිපතා ගෙවීම/ Weekly.
- BWLY - දෙසතියකට වරක් ගෙවීම/ Bi – Weekly.

Purp. - (Purpose of Credit Facility) – ණය පහසුකම ලබාගත්/ප්‍රදානය කළ පරමාර්ථය හා අදාළ කේතයන් මෙමඟින් දැක්වේ. වැඩි විස්තර සඳහා කේත වගුව භාවිතා කරන්න.

Coverage- ණය පහසුකමක් යම් ආකාරයක ආවරණයකට හෝ බැඳීමකට යටත්ව ප්‍රදානයකර ඇතිද යන වග / Security or Guarantee Coverage.

- US & OG - Unsecured & Other Guarantee - සුරැකුම් නොමැත/ අනෙකුත් ඇප ලබාගෙන ඇත.
- US & NG - Un Secured & Not Guaranteed - සුරැකුම් හෝ ඇප ලබාගෙන නොමැත.
- FS & NG - Fully Secured & Not Guaranteed - පූර්ණ සුරැකුම් ඇත/ ඇප ලබාගෙන නොමැත.
- FS & OG - Fully Secured & Other Guarantee - පූර්ණ සුරැකුම් සහ අනෙකුත් ඇප ලබාගෙන ඇත.

Credit Facility for Last 24 Mounts.

මෙම කොටසෙහි දැක්වෙන තොරතුරු සැමවිටම ඉහත විස්තර කරන ලද ණය පහසුකම් පිළිබඳ විස්තර (Credit facility Details) සමඟ බැඳී පවතී.

වී අනුව ණය පහසුකම සඳහා වෙන්කළ අනු අංකයට සම්බන්ධ එහි 'ගෙවුම් අතීතය' (Repayment History) මෙම කොටසෙහි අදාළ අනු අංකය යටතේ පෙන්නුම් කෙරේ. මෙම ගෙවුම් අතීතය ආසන්නතම පසුගිය මාස 24 ක කාලයකට සීමා වේ.

එක් එක් මාසයට අදාළ කොටුව තුල දැක්වෙන්නේ එම මාසයේ අවසාන දිනය වන විට හිඟ මුදලක් (Arrears Amount) පැවතියේ නම්, එය ගෙවීම අතපසු වී ඇති දින ගණනයි.

සියළුම ගෙවීම් ගිවිසගත් පරිදි අදාළ මාසය තුල ගෙවා ඇත්නම් එය එම මාසයට අදාල කොටුව තුල "OK" ලෙස දැක්වේ.

Ownership Details – ණය පහසුකමකට බද්ධ ණයකරුවෙකු (Joint Borrower) හෝ ඇපකරුවෙකු ලෙස සම්බන්ධවී ඇති විටෙක එහි හිමිකාරත්වය දරන අනෙකුත් පාර්ශවයන් පිළිබඳ තොරතුරු මෙහි දැක්වේ.

මෙහිදී ණය පහසුකමෙහි අනු අංකය, හිමිකාරත්වය, අනෙකුත් ණයකරුගේ නම, හැඳුනුම්පත් අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි අංකය සහ අදාළ අනෙකුත් ණයකරුගේ ලිපිනය ආදී විස්තර එහි ඇතුලත්ව ඇත.

Dishonor of Cheques Details – අඟරු චෙක්පත් පිළිබඳ විස්තර.

මෙම කොටස තුල අඟරු චෙක්පත් වාර්තාකළ බැංකුව සහ ශාඛාව, චෙක්පත් අංකය, චෙක්පතෙහි වටිනාකම, අඟරුකළ දිනය, අඟරු කිරීම සඳහා හේතුව ආදී විස්තර ඇතුලත් වේ.

Catalogue Description

ඔබගේ ණය තොරතුරු වාර්තාවේ අඩංගු සියළු කෙටි නාමයන් (කේතයන්) මේ යටතේ සවිස්තරාත්මකව දක්වා ඇත. එම කෙටි නාම වල පැහැදිලි කිරීම් "Credit facility details" යටතේ ඉහත දක්වන ලදී.